# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/03 - 2024 සැප්තැම්බර් මස 23 වැනි සඳුදා - 2024.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය පීඑස්/සීඑස්ජ්/00/1/1/1

### ප්‍රකාශනයයි

මුද්‍රාව

අනුර කුමාර දිසානායක

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා පවත්වන ලද ඡන්ද විමසීමට අනුව, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 61 වැනි වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බවට වර්ෂ දෙදහස් විසි හතරක් වූ සැප්තැම්බර් මස විසි දෙවැනි දිනයේ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති හෙයින්ද,

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාගේ ධුර කාලය වර්ෂ දෙදහස් විසි හතරක් වූ සැප්තැම්බර් මස විසි දෙවැනි දිනයේ දී ආරම්භ වූ හෙයින් ද,

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 වැනි ව්‍යවස්ථාව සහ 157අ ව්‍යවස්ථාවේ (7) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයට ප්‍රතිඥා දී අත්සන් තැබීම මගින් ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා වර්ෂ දෙදහස් විසි හතරක් වූ සැප්තැම්බර් මස විසිතුන් වැනි දිනයේ දී වර්ෂ පහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරය භාරගත් බව මේ ප්‍රකාශයෙන් නිවේදනය කර සිටිනු ලැබේ.

වර්ෂ දෙදහස් විසිහතරක් වූ සැප්තැම්බර් මස විසිතුන් වැනි දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය එන්. එස්. කුමානායක,
ජනාධිපති ලේකම්.

2024 සැප්තැම්බර් මස 23 වන දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

EOG 09 - 0148


1A - G 42726 — 359 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*